**මධ්‍යම පළාත් සභාව - 2022 වර්ෂය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව විශේෂ ව්‍යාපෘති (ලෝක බැංකු ආධාර) යටතේ 560-74-4-3-2602 ශීර්ෂයේ වර්ෂයට අදාළ වියදම රු.559,539,846 ක් වුවද අවසන් ගිණුම සමඟ ඉදිරිපත් කර තිබුණු සටහන 7 ට අනුව එම වියදම රු.559,694,139 ක් වූයෙන් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත හා අවසන් ගිණුම අතර රු.154,293 ක වෙනසක් පැවතුණි. | මෙම ව්‍යාපෘතියට අදාළව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් එවා ඇති රු.154,293 ට අදාළ ජර්නල් සටහන අතපසුවීමකින් භාණ්ඩාගාර පරිසනක මුද්‍රිත වල සටහන් වී නොමැත. දත්ත පද්ධතිය තුළ අදාළ වටිනාකම සටහන් වී ඇත. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ නිවැරදි වියදම දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 2020 වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා මාසවල අයකළ ණය වාරිකයන්ට අමතරව රු.265,633 ක ණය පොලී ගෙවීමද, ණය වාරික ගෙවීම් ලෙස සලකා ගිණුම්ගත කර තිබීමෙන් එම දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂය හා පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | උක්ත ගිණුම්කරණ අඩුපාඩුව අප විසින් පිළිගන්නා අතර ජ'නල් සඳහා අනුමැතිය ලද පසු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | වැරදි නිවැරදි කිරීම් කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තු 06 ක කාර්යාල 03 ක සහ කොමිෂන් සභාවක භාවිතා කරන වාහන 80 කින් වටිනාකම රු.279,290,000 ක් වූ වාහන 30 ක් සහ වටිනාකම සඳහන් නොවූ වාහන 50 ක් එම වාහන ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ හෝ දැනට භාවිතා කරන ආයතන වල හෝ ගිණුම්ගත කර නොතිබුණි. | වාහන 9 ක අයිතිය ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් පවරාගෙන ඇත. අයිතිය පවරා ගෙන නොමැති වාහන දෙකෙන් එකක් ගරු ආණ්ඩුකාරතුමා විසින් භාවිතා කරනු ලබන අතර, එය ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත් සභාව සතුවන අතර අනෙකුත් වාහනය මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයිති බවත්<br><br>සභා ලේකම් කාර්යාලය භාවිතා කරන වාහන තුන ප්‍රධාන ලේකම් සතුව ඇති අතර ප්‍රධාන ලේකම් විමසා එම වාහන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බවත්<br><br>පළාත් විගණන දෙපාර්තමේන්තුව භාවිතා කරන වාහනය මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය සතුව ඇති බැවින්, මෙම කාර්යාලයේ වත්කමක් ලෙස හඳුනා නොගන්නා ලද බවත්<br><br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් භාවිතා කරනු ලබන වාහන 12 දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනිමට කටයුතු සිදු කරමින් පවතින බවත්<br><br>මාර්ග සංවර්ධන අමාත්‍යාංශය භාවිතා කරන ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි වාහන 02 අමාත්‍යාංශය නමින් පවරා ගැනීමටත්<br><br>ප්‍රධාන අමාත්‍යාංශය යටතේ තිබෙන අංක CP PE – 2892 කැබ් රථය සහ ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කර ඇති CP KG-1295 අංක දරණ මෝටර් රථය | අදාළ ආයතනවල භාවිතා කරන පවරා නොගත් වාහන පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් පවරාගෙන තක්සේරු කළ වාහන ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්

අංක CP PE-2896 දරණ වාහනය පේෂකර්ම දෙපාර්තමේන්තුවට පවරාගෙන ඇති බවත්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වාහන 9 ක් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බවත්

ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 26 ක් "මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව" නමින් ලියාපදිංචි කර ගැනීමටත් මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව" නමින් පවරා ගැනීමට ඇති අනෙකුත් වාහන 08 පවරා ගැනීමට අදාළ කටයුතු කරමින් පවතින බවත්

මධ්‍යම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පරිහරණය කරනු ලබන අදාළ වාහන 05 කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් නමින් ලියාපදිංචි කර ඇති බවත් දන්වන අතර මෙම සියළු වාහන ඉදිරියේ දී පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.5.1 ශීර්ෂය 540 - ආණ්ඩුකාරවරයා

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය හා ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි XIII ඡේදය අනුව සත්‍ය වශයෙන්ම සේවයේ නිරතවී සිටින බව තහවුරු කර ගැනීමකින් තොරව, ආණ්ඩුකාරවරයා විසින් කාර්යාල පරිශ්‍රයේ විවිධ නිල හමු හා සාකච්ඡා සඳහා සහභාගී වී තිබූ දිනයන් වලදී ද, ගාල්ල, කොළඹ, නුවරඑළිය වැනි මහනුවර නගරයෙන් දුර බැහැර ප්‍රදේශවල ආණ්ඩුකාරතුමා සමඟ රාජකාරි සඳහා ගමන් කළ බව දක්වමින්, ආණ්ඩුකාරතුමාගේ නිල රථවල හා ආරක්ෂක රථයේ රියදුරන් විසින් ඉදිරිපත් කර තිබුණු ධාවන සාරාංශ සඳහා නිසි අධීක්ෂණයකින් තොරව සාවද්‍ය ලෙස අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු.757,515 ක් හා රු.448,700 ක් ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරන් වෙත ගෙවා තිබුණි. | නිල රථයේ රියදුරු සහ ආරක්ෂක රථයේ රියදුරු ගරු ආණ්ඩුකාරතුමාගේ සැලසුම් කර ඇති රාජකාරි සහ හදිසියේ යෙදෙන රාජකාරි සඳහා සේවයේ යොදවා ඇති අතර, මොවුන්ගේ රාජකාරී ගරු ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් නිර්දේශ කර ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. ගරු ආණ්ඩුකාරතුමා, කාර්යාල පරිශ්‍රයේ විවිධ නිල හමු හා සාකච්ඡා වලට සහභාගී වන ඇතැම් අවස්ථා වලදී විශේෂ කාර්යයන් සඳහා නිල රථය ගාල්ල, කොළඹ, නුවරඑළිය වැනි මහනුවර නගරයෙන් දුර බැහැර ප්‍රදේශ වලට යවන ලද අවස්ථාවන් පැවතුණ ද ඒවා ඉතා සීමිත බවත් මින් ඉදිරියට රියදුරන්ගේ අතිකාල දීමනා සහ ගමන් වියදම් ගෙවීමේදී විශේෂයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු ආණ්ඩුකාරතුමාගේ ලේකම්වරුන් දැණුවත් කර ඇති බවත් දන්වා සිටිමි. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ආ) 2018 ඔක්තෝබර් 12 දිනැති අංකසීඑස්/සීඑස්ජ්/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 7.3 ඡේදයේ උපදෙස්වලට අනනුකූලව ආණ්ඩුකාර තුමා භාවිතා කරන නිල වාහන 02 කට 2020 මැයි සිට 2022 අප්‍රේල් දක්වා මාස 24 ක කාල පරිච්ඡේදය සඳහා ඉන්ධන දීමනාවට අමතරව අතිරේක ඉන්ධන වශයෙන් ලීටර් 6720.21 කට අදාළව රු.930,020 ක් ගෙවීමකර තිබුණි. | 2021 සැප්තැම්බර් 22 වන දින පවත්වන ලද ආණ්ඩුකාර සංසදයේ තීරණයට අනුව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් පළාතෙන් පිට රාජකාරි කටයුතු සඳහා ගමන් කිරීමේදී, ඒ සඳහා වැයවන අතිරේක ඉන්ධන ප්‍රමාණය ප්‍රතිපූරණය කිරීම සිදුකර ඇත. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

(ඇ) ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් 2018 මැයි 23 දිනැති වවුචර් අංක 42 න් ආණ්ඩුකාර නිල නිවස සඳහා මිලදීගෙන තිබුණු වටිනාකම රු.721,920 ක් වූ අඟල් 55, Samsung LED රූපවාහිනී යන්ත්‍ර (UA55H 6400AKK) 02 ක් ඉන්වෙන්ට්‍රි ලේඛන වල ඇතුළත් කර නොතිබූ අතර 2018, 2019, 2020 හා 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඉන්වෙන්ට්‍රිගත නොවූ අයිතම යටතේ භාණ්ඩ සමීක්ෂණ කාර්ය මණ්ඩල මඟින්ද මෙම රූපවාහිනී යන්ත්‍ර භෞතිකව පැවති බවට හඳුනාගෙන නොතිබුණි.

2018 මැයි 23 දිනැති අංක 42 වවුචරයට අනුව Samsung අඟල් 55 රූපවාහිනී යන්ත්‍ර 02 ක් මිලදී ගෙන ඇත. එම රූපවාහිනී පිළිබඳ අංක 03 බඩු වට්ටෝරු පොතේ 80 පිටුවේ සඳහන් කර ඇත. නමුත් අතපසුවීමකින් එහි සඳහන්ව ඇත්තේ එක් රූපවාහිනී යන්ත්‍රයක් පමණි. නැවත 2019 ජූනි 25 දින Philips LED Smart TV - අඟල් 55 රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගෙන ඇත. ඒ අනුව 2018 වර්ෂයේ සිට මේ දක්වා මෙම කාර්යාලයේ පැවති හා පවතින අඟල් 55 රූපවාහිනී යන්ත්‍ර සංඛ්‍යාව 03 කි. භෞතිකව පහත විස්තර දැක්වෙන පරිදි ආණ්ඩුකාර නිල නිවසේ රූපවාහිනී යන්ත්‍ර 02 ක් ද කාර්යාලයේ 01 ක් ද පැවතුණි.

<u>ආණ්ඩුකාර නිල නිවස</u>

| වෙළඳ නාමය | Serial No | ප්‍රමාණය |
|---|---|---|
| Samsung | 03NK3K5K600 | 55’’ |
| JVC | 035123100015 | 55’’ |

<u>කාර්යාලීය ප්‍රධාන ශාලාව</u>

| වෙළඳ නාමය | ප්‍රමාණය |
|---|---|
| Philips LED Smart TV | 55’’ |

වවුචර් අංක 42 න් මිලදී ගත් රූපවාහිනී යන්ත්‍ර 02 පිළිබඳ තොරතුරු අනාවරණය කළ යුතුය.

(ඈ) වටිනාකම සඳහන් නොවූ ඉඩම් හා ගොඩනැගිලි ඒකක 03 ක් ආණ්ඩුකාර කාර්යාලය වෙත පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලයට අයත් ඉඩම මෙතෙක් මෙම ආයතනය පවරා දීමක් සිදු කර නොමැත. එම නිසා ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොමැත.

ආයතනයට අයත් ඉඩම් හා ගොඩනැගිලි පවරාගෙන තක්සේරු කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය.

**1.5.2 ශීර්ෂය 541 - සභා ලේකම් කාර්යාලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 05 ට වඩා පැරණි මියගිය මන්ත්‍රීවරයෙකුගේ රු.92,176 ක ශේෂයක් ද වසර 16 ට වැඩි ධූරය අතහැර ගිය පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ රු.157,114 ක ණය ශේෂයක් ද ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.3, 4.4, 4.5, 4.6 වගන්තීන් අනුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු.92,176 ක ණය ශේෂයක් අය විය යුතුව ඇති අතර හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකුගෙන් අයවිය යුතු රු.157,114 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සහ නීතිපති උපදෙස් ලබාගෙන ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ශීර්ෂය 542 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වසරේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගොඩනැගිල්ලේ අයිතිය පවරාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 ශීර්ෂය 543 - ප්‍රධාන ලේකම් කාර්යාලය - පිරිස් හා පුහුණු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිරිස් හා පුහුණු අංශයට අයත් ගොඩනැගිලි 3 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලි මේ දක්වා තක්සේරු කර නොමැති බවත්, තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර අදාළ තක්සේරු කටයුතු සිදු කරන බවත් දන්වමි. | ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ශීර්ෂය 549 - පළාත් විගණන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් විගණන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ විගණනය කළ යුතු ආයතන 2551 න් ආයතන 305 ක් එනම් සියයට 12 ක ප්‍රතිශතයක් විගණනය කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ විගණනය නොකළ ආයතන සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 88 ක් වූ අතර විගණනය සැලසුම් කිරීමේ දී වර්ෂ 04 ක් හෝ ඊට වැඩි කාලයක් තිස්සේ අඛණ්ඩව විගණනය සිදුකර නොතිබුණු ආයතන (පාසැල් හැර) 304 ක් පැවතුණි. | මෙම කාර්යාලයට අදාළව අනුමත අභ්‍යන්තර විගණන නිලධාරී ප්‍රමාණය 56 කි. මේ දක්වා එම තනතුරු සඳහා බඳවා ගැනීමක් සිදුකොට නොමැති අතර, මෙම කාර්යාලය වෙත අනුයුක්ත කොට ඇති සංවර්ධන නිලධාරීන් 22 දෙනෙකු හා කළමනාකරණ සේවා නිලධාරී 08 දෙනෙකු මඟින් අදාළ විගණන කටයුතු සිදුකර ගෙන යනු ලබයි.<br>මධ්‍යම පළාත් සභාව සතුව පවතින රාජ්‍ය ආයතන 2551 විගණනය සඳහා මෙම කාර්යය මණ්ඩලය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමි. | ප්‍රධාන ආයතන හා ඒ යටතේ ඇති ආයතන වෙන් වෙන්ව හඳුනාගෙන ප්‍රමුඛතාගත කර විගණනය සැලසුම් කළ යුතුය. |

### 1.5.6 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ ස්ථාවර වත්කම් වලින් කපා හරින ලද රු.5,059,270 ක ක්ෂය වීම් සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම් වලින් ලද ආදායම් ලෙස (Income from the recurrent expences) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයේ 2014 වර්ෂයේ සිට සකස් කරන ලද අවසන් ගිණුම් වාර්තා තුළද " විලම්භිත ආදායම" ලෙස පෙර වර්ෂයේ ක්ෂය වටිනාකම ආදායමට එකතුකර පෙර වර්ෂවල ලාභාලාභ ගිණුම සකස්කළ ආකාරයටම 2022 වර්ෂය සඳහාද ලාභාලාභ ගිණුම් සකස් කළ බව සඳහන් කරමි. | ක්ෂයවීම් පුනරාවර්තන වියදම් වලින් ලද ආදායමක් ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |
| (ආ) | ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් වල නියුතු සේවකයන්ගේ රක්ෂණ ආවරණ වෙනුවෙන් සේවක වැටුපෙන් අයකරගත යුතු මුදලට වඩා වැඩි මුදලක් අවකරණය කිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට එකතු වී තිබුණු රු.1,418,085 ක වැඩිපුර අයකළ රක්ෂණාවරණ රක්ෂණ තැන්පතු ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වගකීම් යටතේ දක්වා තිබුණි. | ලබාදෙනු ලබන රක්ෂණ ආවරණයට සරිලන පරිදි සේවකයන්ගේ මාසික වැටුපෙන් අයකරන මුදලට අනුව ඉදිරියේදී ගිවිසුම් ගත විමට රක්ෂණ සමාගම සමඟ කටයුතු කරමි. | රක්ෂණය සමඟ ගිවිසුම්ගතවූ මුදල ඉක්මවා අවකරණය නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2008 අංක 01 දරන මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතන ප්‍රඥප්තියේ 05 වගන්තිය අනුව ආයතනයට රාජ්‍ය අංශයේ හෝ පුද්ගලික අංශයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කරගත යුතු වුවද විගණන දින වූ 2023 ජනවාරි 13 දින වන විට ද එවැන්නක් පිළියෙල කර නොතිබුණි. | ආයතන සංග්‍රහය සහ මධ්‍යම පළාත් මූල්‍ය රීති වලට අමතරව අවශ්‍යයැයි හැඟෙන රෙගුලාසි කළමණාකරණ මණ්ඩල නිළධාරීන් හා එක්ව සාකච්ඡා කරමින් පවතින අතර එවැනි රෙගුලාසි සංග්‍රහයක් සකස් කිරීම සඳහා අවශ්‍ය කෙටුම්පත් සකස් කිරීම ඉදිරියේදී සිදු කරන බව සඳහන් කරමි. | කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටිය කඩිනමින් පිළියෙල කළ යුතුය. |
| (ඈ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කර තිබුණ ද කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයට අයත් වටිනාකම රු.7,330,000 ක් වූ වාහන 05 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | මධ්‍යම පළාත් කර්මාන්ත අමාත්‍යාංශයට අයත් මෝටර් රථය කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයට පවරා දෙන ලෙසට ඉල්ලීම් කර ඇතත්, එසේ කිරීමට හැකියාවක් නොමැති බව කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත. ප්‍රධාන ලේකම් කාර්යාලය සතු කැබ් රථය පවරා ගැනීමට ඉල්ලීම් කර නොමැත. අනෙකුත් වාහන 03 සම්බන්ධයෙන් විගණන විමසුමේ සඳහන් පරිදි ක්‍රියා කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛය අනුව ආයතනය භාවිතා කරන වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ප්‍රාදේශීය සභා පනතේ 268 වන අධිකාරිය සහ නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 5/6(1) වගන්තිවලට අනුකූලව සැලැස්මකින් තොරව 2010 වර්ෂයේ රු.6,500,000 ක් වැයකර ඉදිකරන ලද කටුකිතුල ගිමන්හල අනවසර ඉදිකිරීමක් ලෙස සලකා 2021 අප්‍රේල් 30 දින කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා විසින් ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස නියෝග කර තිබියදී එම වර්ෂයේ දී ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා රු.1,078,459 ක වියදමක් දරා තිබුණි. | මගී ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම ප්‍රායෝගික නොවේ. වර්තමානය වනවිට මෙම ගොඩනැගිල්ලේ වටිනාකම ඉතා ඉහළ ගොස් ඇත. එබැවින් අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම රජයට කරනු ලබන ඉමහත් පාඩුවක් වන අතර ඒ පිළිබඳව සලකා බලන ලෙසට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ලිඛිතව දන්වා ඇත. එම ගොඩනැගිල්ලේ වටිනාකම හා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සලකා බලා අදාළ වියදම දරමින් එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කටයුතු සිදු කරන ලද බව දන්වමි. | ප්‍රාදේශීය සභා පනතේ සහ නිවාස හා නගර සංවර්ධන පනත අභිබවා කටයුතු නොකළ යුතුය. |
| (ඊ) 2012 අගෝස්තු 20 දින සිට 2018 සැප්තැම්බර් 30 දක්වා කටුකිතුල ගිමන්හල බදු දී තිබුණු ග්‍රීන්පාක් හෝල්ඩිංග්ස් ආයතනයෙන් අයවිය යුතු රු.3,167,023 ක මුදල 2023 ජනවාරි 16 වන දිනට ගොඩනැගිල්ල භාරදී වර්ෂ 03 කට අධික කාලයක් ගතව තිබුණද එම මුදල අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | ග්‍රීන්පාර්ක් හෝල්ඩින්ස් ආයතනයට විරුද්ධව නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය කොත්මලේ ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද පූනාඔය ඇල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඉටු නොකළ කාර්යයන් සඳහා රු.241,419 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණු අතර මෙම ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා විගණන විමසුම මඟින් පෙන්වා දී තිබුණු රු.314,951 ක අඩුපාඩු ද නිවැරදි කර නොතිබුණු බව දෙවන අදියර පරීක්ෂාවේ දී තහවුරු විය. | විගණන විමසුමෙහි සඳහන් පළමු අදියරේ අඩුපාඩු කඩිනමින් සකස් කිරීමට හෝ මීටර් 13ක ඉන්ටලොක් ගල් ඇතිරීම සඳහා වන රු.208,063 ක මුදල හා අතුරා ඇති ඉන්ටලොක් ගල් අතරට ගල් කුඩු දැමීම සඳහා රු.96,888 ක මුදල වශයෙන් රු.304,951 ක මුදලක් ගෙවන ලෙස අදාළ සමිතියට දන්වා යවන ලද බව සහ 2 වන අදියරේ රු.101,747 ක අඩුපාඩු සකස් කිරීමටත් කොත්මලේ ප්‍රාදේශීය සභාව විසින් පෙන්වා දී ඇත. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට හෝ අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය - 550 - ප්‍රධාන අමාත්‍යාංශය**

**1.5.7.1 පළාත් පුස්තකාල සේවා මණ්ඩලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය ගැනුම් මිලට සියයට 20 ක ලාභ ප්‍රතිශතයක් මත විකුණුම් මිල ගණනය කරන අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් විකුණුම් අනුව මුද්‍රිත ද්‍රව්‍ය වල පිරිවැය වටිනාකම රු.647,347 ක් විය යුතු වුවද එය රු.3,862,865 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වීම හේතුවෙන් විකුණුම් ද්‍රව්‍ය වල පිරිවැය රු.3,215,518 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි මුද්‍රිත ද්‍රව්‍ය විකුණුම් පිරිවැය රු.3,215,518 ක් වැඩිපුර ඇතුළත් කර ඇති බව පිළිගන්නා අතර පුස්තකාල සේවා මණ්ඩලය විසින් සකස් කරන ලද පළමු ගිණුම බැවින් මෙවැනි අඩුපාඩු සිදුව ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් අනාවරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) තොග ලේඛනය අනුව මුද්‍රිත ද්‍රව්‍ය අවසන් තොගයේ වටිනාකම රු.1,184,977 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.2,000,973 ක් ලෙස දැක්වීම හේතුවෙන් අවසන් තොගය රු.815,995 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අවසාන තොගයේ වටිනාකම රු.815,995 ක් වැඩියෙන් දක්වා ඇති බව පිළිගනිමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් අනාවරණය කළ යුතුය. |
| (ඇ) 2018 අගෝස්තු මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයෙන් බදු මුදල් ලෙස මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය වෙත අයවියයුතු රු.3,145,011 ක් අයකරගෙන නොතිබුණි. | මෙම මුදල අයකරගැනීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්තුමන්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමන් සහ අදාළ පාර්ශවයන් කැඳවා සාකච්ඡාකොට තීරණයක් ගැනීමට නියමිතව ඇති බව දන්වමි. | හිඟ බදු මුදල අයකර ගත යුතුය. |

### 1.5.8 ශීර්ෂය 551 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතන 05 ක් සඳහා විගණකාධිපතිතුමා විසින් 2019 සිට 2022 අතර කාල පරාසය තුළ නිකුත් කර තිබූ අධිභාර සහතික 10 කට අදාළව රු.8,682,675 ක අධිභාර මුදල් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද අය කර නොතිබුණි. | මේ වන විට අධිභාර 10 කින් රු.8,682,675 ක් අය වීමට ඇත. එනම්,<br>• මාතලේ මහ නගර සභාව - අධිභාර 02 කින් රු.2,337,907 ක් අයවීමට ඇත. (අභියාචනා තීරණ මෙතෙක් ලැබී නැත.)<br>• උඩුනුවර ප්‍රාදේශීය සභවෙන් අධිභාර 02 කින් රු.1,020,465 ක් හා රු.64,820 ක් ද අයවීමට ඇත.<br>• රත්තොට ප්‍රාදේශීය සභාවෙන් අධිභාර 02 කින් රු.3,619,800 ක් අයවීමට ඇත. (අභියාචනා සිදු කරමින් පවතී)<br>• දඹුල්ල මහ නගර සභාවෙන් අධිභාර 03 කින් රු.408,773 ක් අයවීමට ඇත. | අධිභාර මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | • කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවෙන් අධිභාර 01 කින් රු.1,230,910 ක් අයවීමට ඇත. (අභියාචනා සිදු කරමින් පවතී) |

### 1.5.9 ශීර්ෂය 552 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප අධ්‍යාපන කාර්යාල 15 හි සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විදුහල්පති පුරප්පාඩු 505 ක් සඳහා වැඩ බලන විදුහල්පතිවරුන් පත්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහනුවර, දෙනුවර, ගම්පල, කටුගස්තොට, වත්තේගම, නාඋල, තෙල්දෙණිය, හඟුරන්කෙත හා මාතලේ කලාපවල විදුහල්පති ශ්‍රේණිධාරීන් 188 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් විධිමත් පරිදි විදුහල්පතිවරුන් සේවයට බඳවාගෙන ස්ථානගත කරන තෙක් පුරප්පාඩු පවතින පාසල්වල ගුරු සේවයේ I නිළධාරීන් මඟින් රාජකාරි ආවරණය කිරිම සඳහා වැඩ බලන විදුහල්පතිවරු පත් කිරීම කටයුතු සිදු කර ඇත. | අතිරික්ත විදුහල්පතිවරුන් විදුහල්පති පුරප්පාඩු පවතින පාසල් වලට අනුයුක්ත කර පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලය විසින් හඟුරන්කෙත මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙන් 2011 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා ශේෂ ගුරු වැටුප් සහ අවකරණ මඟින් රු.14,239,938 ක අක්‍රමිකතාවයක් සිදුකර ඇති බව අනාවරණය කරගෙන තිබුණු අතර, එම මුදලින් රු.10,423,348 ක මුදලක් දැනට අයකරගෙන තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට රු.3,816,590 ක මුදලක් තවදුරටත් අයවීමට තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් 2022 ජූනි 08 දින අංක CPC/CS/01/05/01/01/99 යටතේ පත්කර තිබූ මූලික විමර්ශන කමිටු වාර්තාව මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලයේ සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතාවයේ අනාවරණය කරනු ලැබූ මුළු මුදලින් තවදුරටත් අයකර ගැනීමට පැවති රු.3,696,920 ක මුදල ගෙවීමට, අක්‍රමිකතාවය සිදු කළ පුද්ගලයාට ලිඛිතව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින්ද පරීක්ෂණයක් සිදුකරනු ලබයි.<br>මූලික විමර්ශනයට අනුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මෙම අක්‍රමිකතාවයට සම්බන්ධ චූදිතයින් වූ ගුරු සේවයේ නිලධාරීන් දෙදෙනා හා පාසල් කම්කරු තනතුරේ සේවකයාගේ රාජකාරී වැඩ තහනම් කර ඇත. | වගකිව යුතු පාර්ශවයන්ට නීති මඟින් කටයුතු කර සිදුවූ අලාභය කඩිනමින් අය කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) තෙල්දෙණිය කලාප අධ්‍යාපන කාර්යාලය සඳහා අනුමත පාසල් කාර්ය සහායක තනතුරු 63 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට 137 දෙනෙකු සේවයේ යෙදවීම නිසා 74 දෙනෙකු අතිරික්තවී තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පාසල් කාර්ය සහායකයින් ප්‍රමාණයක් සිටිය ද එම සියලු සේවකයන් පාසල්වල විවිධ කාර්යයන් සඳහා යොදවා ඇති අතරම කලාපයේ සියලු පාසල් වල කටයුතු ඉටු කිරීම සඳහා මේ වන විට සේවයේ නියුතු පාසල් කාර්ය සහායකයින් ප්‍රමාණවත් නොවන බව වැඩිදුරටත් දන්වමි. | අතිරික්ත කාර්ය මණ්ඩලය අවශ්‍යතාවය පරිදි අනුමත කර ගැනීමට හෝ පුරප්පාඩු පවතින ප්‍රදේශවලට අනුයුක්ත කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඈ) තෙල්දෙණිය කලාපයේ ස්ථානමාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු.1,919,102 ක ණය ශේෂයක් 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර දෙනුවර කලාපයේ විශ්‍රාමගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.78,363 ක ණය ශේෂයක් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.3, 4.4, 4.5, 4.6 වගන්තීන් අනුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | තෙල්දෙණිය කලාපයේ ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වලින් රු.139,700 ක මුදලක් 2022 වර්ෂයේ නිරවුල් කර ඇති අතර, රු.1,781,264 ක ණය ශේෂ තව දුරටත් නිරවුල් කිරීමට ඇත.<br>දෙනුවර කලාපයේ අයවීමට ඇති ණය ශේෂය රු. 78,363 කි. | චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.10 ශීර්ෂය 553 - පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 31 හෙවත් රු.34,093,392 ක ආදායම් හිඟහිටව පැවතුණි. | ඉදිරියට හිඟ බදු ප්‍රමාණය අවම කර ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කරමි. | හිඟ බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) දීර්ඝකාලීන බදු පදනම මත මාතලේ ලංකා බැංකු ශාඛාවට ලබාදී තිබූ හෙක්ටයාර් 0.2056 ක රජයේ ඉඩමෙහි තිස් අවුරුදු | බදු අයකිරීම සිදුවිය යුත්තේ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/10/22146 හා 2021/08/02 දිනැති ලිපියේ බදු | බදු නොගෙවූ කාලයට අදාළ සියළුම බදු මුදල් |

| | | |
|---|---|---|
| බදු කාලය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වී තිබුණද වර්තමාන තක්සේරුව අනුව නව බදු ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු බදු මුදලක් එම බැංකු ශාඛාවෙන් අයකර ගැනීමට පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අනුමැතිය මත බැවින් එහි සඳහන් පරිදි බදු මුදල් අයකිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා මාතලේ ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති බවත් ඒ අනුව ප්‍රාදේශීය ලේකම් විසින් අය කිරීම් සිදු කරනු ඇත. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.11 ශීර්ෂය 557 - මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2006 වර්ෂයේ සී/ස උඩදුම්බර විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබාදුන් රු.1,950,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 16 ක් ගතවී තිබුනද අයවීමට තිබූ ණය ශේෂය රු.1,494,220 ක් විය. එසේම 1991 වසරේ සිට 2001 වසර දක්වා වසර 10 ක් තුළ අවස්ථා කිහිපයකදී මිණිපේ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබා දී තිබූ රු.750,000 ක ණය මුදලින් වසර 21 සිට 31 දක්වා කාල පරාසයක් තුළ රු.292,000 ක ණය මුදලක් පමණක් පියවා තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට රු.458,000 ක ණය ශේෂයක් පියවීමට තිබුණි. | උඩදුම්බර විවිධ සේවා සමූපකාර සමිතියේ හිඟ ණය සම්බන්ධයෙන් නීති නිලධාරින්ගේ නිර්දේශ මත සමිතියේ ගොඩනැගිලි කුලී ආදායමින් ගෙවීමට එකඟ කරවා ගෙන ඇත. 2023 වර්ෂයේ සමිතියේ උසාවි දඩමුදල් වලින් රු.316,280 ක මුදලක් අයකරගෙන ඇති අතර 2023 මැයි 22 වන දිනට ශේෂය රු.1,272,320 ක් වන බවද සඳහන් කරමි. මිණිපේ සමිතිය සඳහා රු.5,000 ක වාරික වශයෙන් ගෙවීමට ඉඩ සලසා ඇත. 2023 මැයි 22 දිනට ශේෂය රු.433,000 ක් වේ. | හිඟ ණය වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සමූපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමූපකාර සමිති 1,799 කින් වර්ෂය තුළ සමිති 1,127 ක ගිණුම් විගණනය කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් සියයට 32 හෙවත් සමිති 358 ක ගිණුම් පමණක් විගණනය කර තිබුණු අතර සියයට 68 ක් වන සමිති 769 ක ගිණුම් විගණනය සිදුකර නොතිබුණි. සමිති 297 ක ගිණුම් සඳහා කල් පසු වූ විගණනය සැලසුම් කර තිබුණද, ඉන් සමිති 82 ක පමණක් විගණනය අවසන් කර තිබුණි. | මෙම වර්ෂය අවසන් වීමට පෙර සියලුම කල් පසු වූ විගණනයන් හා වර්තමාන විගණනයන් අවසන් කෙරෙන අතර එසේ නොකරන නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල කටයුතු ආරම්භ කෙරෙනු ඇත. | සමූපකාර සමිතිවල විගණනය අදාළ කාලය තුළ ඉටු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිළධාරීන් වෙත ලබාදී තිබූ 46 (1) පරීක්ෂණ 06 ක් 2023 පෙබරවාරි 17 වන දින වනවිට අවු: 01 සිට අවු: 04 කට ආසන්න කාලයක් ගත වී ඇතත් පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ලබා දී නොතිබුණි. | 46(1) පරීක්ෂණ නිමකර 2023 මැයි 31 ට පෙර වාර්තා ලබා නොදුන් නිලධාරීන්ට විනයානුකූල කටයුතු ආරම්භ කරන බවට නියෝග ලබා දී ඇත. | වාර්තා ලබාගෙන එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) දෙපාර්තමේන්තුව සතු වටිනාකම රු.104,936,000 ක් වූ ඉඩමක් පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමට නියමිත අතර, ඒ සඳහා නිවාස සංවර්ධන අදිකාරිය කටයුතු සිදු කරමින් පවතී. | පවරා ගෙන ගිණුම් තැබීමට හෝ කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමට ක්‍රියාකළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 561 - මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය මඟින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 05 වන වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින කාර්යාල 03 ක රජයේ නිවාස 13 කින් අයකළ යුතු රු.1,120,541 ක නිවාස කුලී අයකර නොතිබුණි. | මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සඳහා වෙන් වූ උපලේඛණගත නිල නිවාසය සඳහා අය විය යුතු හිඟ නිල නිවාස කුලිය අය කර ඇත.<br><br>අංක 321/1 නිල නිවසට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරුවක් ලබා ගැනීමෙන් පසු අදාළ හිඟ මුදල්, හෙද ආචාරිණී නිල නිවස, 2019 ජුලි 01 දින සිට 2020 අප්‍රේල් මස දක්වා හිඟ නිල නිවාස මුදල් සහ දිගන පුනරුත්ථාපන රෝහල සඳහා ලබා දී ඇති උපලේඛණ ගත නොවන නිල නිවාස 10 හි පදිංචි නිලධාරින්ගෙන් නිල නිවාස 08 ක, 2021 ජනවාරි 01 දින සිට 2022 ජුලි 31 දින දක්වා කුලී මුදල් අඩුවෙන් අය කිරීම හේතුවෙන් අය නොකළ හිඟ මුදල් ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරන බව දන්වමි.<br><br>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි නිල නිවස සඳහා හිඟ කුලී මුදල් මෙතෙක් අය කර නොමැත. | හිඟ නිල නිවාස කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2019 මැයි 09 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිවයුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණු, මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ තීන්ත ආලේප කිරීම යනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිලධාරීන් 12 දෙදෙනෙකුගෙන් රු.2,584,716 ක් අයකරගෙන නොතිබුණි. | මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණ තීන්ත ආලේප කිරීම සඳහා තවදුරටත් අධිභාර කිරීමට ඇති මුදල රු.2,555,816 කි. | අධිභාරය කඩිනමින් අය කර ගත යුතුය. |
| (ඇ) ප්‍රාථමික සෞඛ්‍ය සවිබල ගැන්වීම් ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේ වෛද්‍ය හා වෛද්‍ය නොවන උපකරණ මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව අනුමත කළ පිරිවිතරවලට පරිබාහිරව රු.661,550 ක් වැඩියෙන් ගෙවා ශීතකරණ 15 ක් මිලදී ගෙන තිබුණද අදාළ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | විදුලි උපකරණ ආනයන සඳහා ද සීමා පැවති බැවින් සීමිත ප්‍රතිපාදන තුළ ශීතකරණ 15 ක් මිල දී ගන්නා ලද බව | තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියෙන් බැහැරව මිලදී ගැනීම් නොකළ යුතුය. |
| (ඈ) 2021 නොවැම්බර් මස සිට උලපනේ ප්‍රාදේශීය රෝහලට ස්ථාන මාරු කර තිබුණු වෛද්‍ය නිලධාරීවරයෙකු සේවය සඳහා වාර්තා කර නොතිබියදී 2021 නොවැම්බර් මස සිට 2022 සැප්තැම්බර් දක්වා රු.1,638,105 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවය කරන ලද වෛද්‍ය නිලධාරියෙකු ස්ථිරව උලපනේ ප්‍රාදේශීය රෝහලට ස්ථිරව ස්ථාන මාරු කර ඇත. නමුත්, මෙම වෛද්‍ය වරයා උලපනේ ප්‍රාදේශීය රෝහලේ සේවයට අනුයුක්ත කර තිබියදී, තාවකාලිකව නාවලපිටිය රෝහලට ස්ථාන මාරු කිරීම අනුව එහි සේවයට වාර්තා කර ඇති බව පෙන්වා දෙමි. | සේවයට වාර්තා කළ බවට තහවුරු කරගෙන වැටුප් ගෙවිය යුතුය. |
| (ඉ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක රෝහල්වල සමාලෝචිත වර්ෂය අවසානයට සිදු කළ විගණන නියැදි පරීක්ෂාවේදී රු.3,195,083 ක ඖෂධ ඌණතාවයක් හඳුනාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවේදී රු.3,195,083 ක මුදලක ඖෂධ ඌණතාවයන් ඇති බව පෙන්වා දී ඇත. ආයතනයේ ඇති ප්‍රධාන ඖෂධ ගබඩාවෙන් අංශ වෙත එක්වර ඖෂධ නිකුත් කරනු ලබයි. එවැනි අවස්ථාවල එම ප්‍රමාණයන් ප්‍රධාන ලෙජරයේ ඇතුලත් නොකර ඖෂධ සියල්ලම නිකුත් කර පසුව ප්‍රධාන ලෙජරයේ සටහන් තබනු ලබයි. එසේ ප්‍රධාන ලෙජරයට ඇතුලත් කිරීමට පෙර විගණනයට භාජණය වීම නිසා මෙම ඌණතාවයන් පෙන්වා දී ඇත. පසුව ප්‍රධාන | ඖෂධ නිකුත් කිරීමේ දී යාවත්කාලීනව සටහන් තබා ගත යුතු අතර ඖෂධ නිකුත් කර, පසුව ලේඛණගත කිරීම සිදු නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| | ලෙජරය යාවත්කාලීන කළ පසු එම ඖෂධ වල ඌණතාවයක් නොමැත. වර්ෂය අවසානයේදී සිදු කරන ලද ගබඩා සමීක්ෂණයේදීද ඒ බව තහවුරු වී ඇත. | |
| (ඊ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත වාහනවලට සිදු වූ අනතුරු 79 කට අදාළ රු.65,198,101 ක අලාභ හානි සම්බන්ධයෙන් අනතුර සිදුවී වසර 01 ත් 18 ත් අතර කාලයක් ඉක්ම ගොස් තිබුණද කඩිනමින් ක්‍රියා මාර්ග ගෙන අලාභ අය කිරීමට හා අනෙකුත් පරීක්ෂණ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල විෂය නිලධාරීන් සහ අදාළ නිලධාරි කැඳවා රැස්වීම් පවත්වා ඉදිරි කටයුතු කළ යුතු ආකාරය දැනුවත් කර මේ වන විට අලාභ අය කිරීමට හා අනෙකුත් පරීක්ෂණ අවසන් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | පරීක්ෂණ කඩිනමින් අවසන්කර අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) 2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් සැකසීමේදී වැටුප් රාජකාරී ඉටු කළ නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ හා සමීපතමයින්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු.51,961,088 ක් සහ බැංකු ගිණුම් අංක මඟින් තහවුරු නොවන රු.1,077,550 ක් වශයෙන් එකතුව රු.53,038,638 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කර තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ වගකිවයුතු පාර්ශව හඳුනාගෙන වංචා කළ මුදල් අය කර ගැනීමට හා වගකිවයුතු පාර්ශව හඳුනාගෙන ඔවුනට එරෙහිව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කර නොතිබුණි. | මහනුවර නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් වංචාව සම්බන්ධයෙන් මේ වන විට වැටුප් කට්ටල රාජකාරි කළ නිලධාරින් දෙනෙකුගේ සේවය අත්හිටුවා ඇත. මේ සම්බන්ධව නෛතික කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මු.රෙ. 104(4) ප්‍රකාරව කටයුතු සිදුකර ඇති බව දන්වා සිටිමි.<br>මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විගණන අංශය මඟින් සිදු කරන ලද හදිසි පරීක්ෂාවට අනුව අනාවරනය වී ඇති මුදල නොපමාව ගෙවීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරින්ට 2022 ජනවාරි 05 දින හා 2022 ජනවාරි 10 දින ලියාපදිංචි තැපැලෙන් යොමු කළ ලිපි වලට ප්‍රතිචාර වශයෙන් එක් නිලධාරිනියක පමණක් රු.200,000 ක මුදලක් මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගිණුමට බැර කර ඇත. | සිදුවී ඇති සම්පූර්ණ අලාභය අයකර ගැනීමටත් වංචා කළ අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමත් සිදුකළ යුතුය. |
| (ඌ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණට පටහැනි කාර්යයන් 17 ක් වෙනුවෙන් එකතුව රු.43,726,909 ක් වූ මුදලක් සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණි. | • ප්‍රාදේශීය රෝහල්වල වෛද්‍ය නිලධාරි හා කාර්ය මණ්ඩල නිල නිවාස අළුත්වැඩියා කිරීම.<br>• ක්ෂේත්‍ර සෞඛ්‍ය සායන සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි නිල නිවාස අළුත්වැඩියා කිරීම.<br>• ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා පළාත් සෞඛ්‍ය සේවා | ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අධ්‍යක්ෂ කාර්යාල වැඩි දියුණු කිරීම.<br>• කඩුගන්නාව ප්‍රාදේශීය සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම - මූලික වැඩ සහ අත්‍යාවශ්‍ය කාර්යන් සිදු කර ඇත. | |
| (එ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ආයතන 04 ක පැවති එකතුව රු.11,943,694 ක යන්ත්‍ර හා උපකරණ 34 ක් භාවිතයට ගත නොහැකිවීම මත නිශ්ක්‍රියව පැවතුණි. මේවා පරීක්ෂා කර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම උපකරණ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය වෙත දී අළුත් වැඩියාකර ගත් නමුත්, නැවත නැවත ක්‍රියා විරහිත වන බැවින් ඒවා භාවිතයට ගැනීමට නොහැකි අතර තව දුරටත් අළුත්වැඩියා කළ හැකිද යන්න බලා නොහැකිනම් අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමටත් එසේ නොහැකි ඒවා අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ධාවන තත්ත්වයේ නොපවතින වාහන 42 ක් අවුරුදු 01 ත් 10 ත් අතර කාල පරාසයක සිට ගාල් කර තිබුණද එම වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණ කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන 04 ක් අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත. වාහන 7 ක් ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. වාහන 02 ක් තීරණයක් ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර ඇත.<br>වාහන 02 ක් අමතර කොටස් නොමැති වීම නිසා අළුත් වැඩියා කිරීමට යොමු කර නැත.<br>වාහන 05 ක් ප්‍රධාන ලේකම් වෙත භාරදීමටත්, වාහන 03 ක් මහනුවර මහ නගර සභාව වෙත භාරදීමටත් කටයුතු කරමින් පවතින අතර වාහන 02 ක් ප්‍රධාන ලේකම් කාර්යාලයට භාරදී ඇත.<br>වාහන 08 ක් අපහරණය කර ඇති අතර<br>වාහන 03 ක් දැනට ආයතනය සතුව නොපවතී. ඉතිරි වාහන වලින් 04 ක් ධාවනය වන අතර තවත් වාහනයක් අලුත්වැඩියා කරමින්ද අනික් වාහනය ඉංජිනේරු නිර්දේශය ලබා ගැනීමටද යොමුකර ඇත. | නිශ්කාර්ය තත්ත්වයේ පැවති වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඔ) 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 18/2001 චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාල සීමාව අවුරුදු 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුම ස්ථාන මාරු ක්‍රමයට යටත් විය යුතු වුවද, දෙපාර්තමේන්තු යටතේ සේවය කරන ලද නිලධාරීන් 213 දෙනෙකු වසර 05 සිට වසර 31 කට අධික කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුණි. | මෙම සේවකයින්ගේ ස්ථාන මාරු වීම් නව බඳවා ගැනීම් සිදු කරන තෙක් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති අතර ඒ හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී ස්ථාන මාරුවීම් සිදු කළ හැක්කේ ඉතා සීමිත සංඛ්‍යාවක් වන බැවින් එකම ස්ථානයේ වැඩි කාලයක් ස්ථාන මාරු ලබා දීමට නොහැකි පිරිසක් සිටීමට හේතු වී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඕ) 2014 ඔක්තෝබර් මස 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරින් 426 කගේ රු.21,045,704 ක ණය ශේෂයක් මාස 03 සිට වසර 05 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරු වී ගිය නිලධාරින් 426 කගේ රු.21,045,704 ක ණය ශේෂයෙන් මේ වන විට රු.37,000 ක් නිරවුල් කර ඉතිරි රු.21,008,704 ක ශේෂය නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |
| (ක) 2014 ඔක්තෝබර් මස 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරු වී පැමිණි නිලධාරින් 348 කගේ රු.16,643,408 ක ණය ශේෂයක් මාස 03 සිට වසර 05 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද එම ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරු වී පැමිණි නිලධාරින් 348 කගේ රු.16,643,408 ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ග) වසර 05 ට වඩා පැරණි මියගිය නිලධාරින් 15 දෙනෙකුගේ රු.742,899 ක ශේෂයක් ද විශ්‍රාම ගිය නිලධාරින් 115 දෙනෙකුගේ වසර 04 කට වැඩි රු.1,627,812 ක ණය ශේෂයක් ද ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.3, 4.4, 4.5, 4.6 වගන්තීන් අනුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මිය ගිය නිලධාරීන්ගේ ශේෂ සහ විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණය ශේෂ නිරවුල් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ජ) දිගින් දිගටම පැවත එන මධ්‍යම රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.171,988,242 ක අත්තිකාරම් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂ සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | අග්‍රිම ශේෂය නිරවුල් කළ යුතුය. |

**1.5.13 ශීර්ෂය 562 - මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරය සඳහා ලීටර් 790 ක මී පැණි තොග මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය හා සාම්පල් පරීක්ෂා කිරීමෙන් ලද ප්‍රතිඵල අනුව කටයුතු නොකර සැපයුම්කරුවකු තෝරාගෙන ඉහළ මිලක් යටතේ මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. | 2022 වර්ෂයේ ප්‍රසම්පාදන කමිටු තීරණ 26 අනුව මී පැණි ලීටර් 790 ක් මිලදී ගැනීමට තීරණය කර ඇතත් පැවති ප්‍රතිපාදන මත මිලදී ගෙන ඇත්තේ මීපැණි ලීටර් 480 ක් පමණි. මෙම සැපයුමට අදාළ බිල්පත් මේවන විටත් නිරවුල් කර නොමැත. තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් සියලුම ඖෂධ සාම්පල් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවම මිල සඳහන් මී පැණි මිල දී ගැනීම නිර්දේශ කර තිබුණි. අවම මිල රු.900 ක් බැවින් වෙළඳ පොලේ මී පැණි මිල හා සැසැඳීමේදී මෙම මිල අතාත්වික පහළ අගයක් ගන්නා බැවින් හා ඇගයුම් කමිටු සමාජිකයෙක් මී පැණි වල ප්‍රමිතිය පිළිබඳ සෑහීමට පත්විය නොහැකි බව සටහන් යොදා තිබීම නිසා මී පැණි සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතියට (SLS 464) අනුකූලද යන්න පරීක්ෂා කිරීමට ප්‍රසම්පාදන කමිටුව එකමතිකව තීරණය කිරීමෙන් අනතුරුව වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රසායනාගාරයෙන් පරීක්ෂණ වාර්තාවන් ලබා ගන්නා ලදි. ඒ අනුව මී පැණි වල වඩා වැදගත් ඇගයුම් උපමානයන් අනුව SLS 464 සඳහන් පරාමිතීන් (Parameter) අනුව විද්‍යාත්මකව තරාගත කිරීමෙන් අනතුරුව SLS 464 සඳහන් පරාමිතීන්ට ආසන්න වන ප්‍රමිතියක් සහිත මී පැණි මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තිරණය කර ඇත. | තාක්ෂණික ඇගයුම් කමිටුවේ නිර්දේශය හා රසායනාගාර වාර්තා නිර්දේශය අනුව මිලදී ගැනීම් කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 570 - මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අමාත්‍යාංශය සතු වටිනාකම රු.32,875,000 ක් වූ ඉඩම් 04 ක් සහ වටිනාකම සඳහන් නොවූ ඉඩම් 09 ක් පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් 2 ක මැනුම් කටයුතු හා තක්සේරු කටයුතු සිදු කෙරෙමින් පවතී. ඉඩම් 6 ක පරිහරණය හා පාලනය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන අතර මේ වන විට අධිකාරියේ වත්කම් ලේඛනයට ඇතුළත් කර ගිණුම්ගත කර ඇති බවත් අමාත්‍යාංශය | ඉඩම් පවරාගෙන තක්සේරු කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

සතු එක් ඉඩමක් මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ගිණුම්ගත කර ඇති බවත් දන්වා සිටිමි. ඉතිරි ඉඩම් 04 න් ඉඩම් කැබලි 03 ක් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ද අනෙක් ඉඩම මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ද භාවිතා කරනු ලබන ඉඩම් වේ.

**1.5.14.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571 අනුව වර්ෂ 02 ක් ඉක්ම වූ රු.1,291,196 ක තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු1,291,196 ක තැන්පතු සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් සිටිමි. | කල් ඉකුත් වූ තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල පිහිටි අධිකාරියට අයත් කඩ කාමර 219 කින් කඩකාමර 196 ක් සඳහා 2001 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු හිඟ කඩ කාමර කුලිය රු.15,565,370 ක් වූ අතර විගණන දින වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි. ඉන් කඩ කාමර 13 ක් සඳහා ගිවිසුම්වලට ද එළඹී නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ කඩ කාමර කුලී අතරින් 2023 මැයි 23 දින වන විට රු.5,163,486 ක හිඟ කඩ කාමර කුලියක් සහ ඊට අදාළ රු.21,719 ක අධිභාර මුදලක් අය කර ගෙන ඇත. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලික අධියර අවසන් වී 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබුණු රු.24,228,128 ක ව්‍යාපෘති මුදල් උපයෝගී කර ගෙන අධිකාරියෙහි සමස්ථ කාර්යය මණ්ඩලයෙන් සියයට 71 ක ප්‍රතිශතයකට KMTT දීමනාව වශයෙන් අමතර දීමනාවක් ගෙවා තිබුණි. | මහනුවර බස්රථ පාලන වැඩසටහනට අදාළ මූලික අදියරයෙහි ගිවිසුම 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද මෙම පාලන වැඩසටහනෙහි ඇතුලත් කාර්යයන් මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදි කර අවසන් වන තෙක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මත ඒ සඳහා යොදවා ගන්නා ලද සේවක කණ්ඩායම් සඳහා මුල් අදියරෙහි ගෙවීම් සිදු කළ ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි සියළුම සේවකයන්ට නොව මෙම පාලන වැඩසටහනට පමණක් දායක වූ සේවක කණ්ඩායම්වල ඉල්ලීම් අනුව දීමනා ගෙවා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කාර්ය මණ්ඩල දීමනා ගෙවිය යුතුය. |

**1.5.14.2** මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගටනේතැන්න මැදගම්මැද්ද මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ සංශෝධිත ඇස්තමේන්තුවෙහි 2.10 (b) වැඩ විෂයෙහි Asphalt Binder මෙ.ටො.244.5 ක්, ඒකකයක් රු.13,892 බැගින් එකතුව රු.3,396,594 කට ඇස්තමේන්තු කර තිබුණු අතර, මේ සඳහා අධිකාරිය Core thickness සාමාන්‍ය මි.මි.62.5 ක් ලෙස ගණනය කර තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ බිල්පතේ මිනුම් පත්‍රයට අනුව Asphalt Binder මෙ.ටොන් 244.5 කට ගෙවා තිබුණි. එහෙත් අවස්ථා 05 ක දී සිදු කරන ලද ABB රසායනාගාර පරීක්ෂණ වාර්තා වලට අනුව Core thickness සාමාන්‍ය අගය මි.මි.30.8 ක් වූයෙන් භාවිතා කරන ලද මෙ.ටොන්.123.5 ක Asphalt Binder ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට මෙ.ටොන් 121 ක් සඳහා රු.1,680,932 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | ABB Layer වලද Core සාම්පල් ලබාගැනීමේ දී ABB වැඩියෙන් අතුරණු ලැබූ පෘෂ්ඨීය කොටස් මෙම Core සාම්පල සඳහා ඇතුලත්ව නොවී තිබිය හැක. ඒ අනුව Core සාම්පල වල සාමාන්‍යය ගෙන ගණනය කරන ලද අතුරන ලැබූ ABB ප්‍රමාණයෙහි හා ඇස්තමේන්තුවේ පවතින ABB ප්‍රමාණය අතර වෙනසක් පැවතිය හැකිය. ඒ අනුව මෙම කර්මාන්තය සඳහා වැඩබිමට ගෙන එන ලද ABB ප්‍රමාණය පදනම් කරගනිමින් ගෙවීම් කර ඇති දන්වා සිටිමි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) උඩිස්පත්තුව ගල්මල්ඕය මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ Asphalt Binder යෙදීම පිළිබඳව සිදුකරන ලද රසායනික පරීක්ෂණ වාර්තා Asphalt Core Cutting (ABB) අවස්ථා 11 කින් 03 ක Core Thickness (ABB) හි අගයක් සඳහන් වී නොතිබුණි. නිම කරන ලද කර්මාන්තයෙහි කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද මිනුම් පත්‍ර අනුව Asphalt Binder මෙ.ටොන්.300 කට ගෙවා තිබුණි. රසායනික පරීක්ෂණ වාර්තාවල (ABB) Core Thickness හි සාමාන්‍ය අගය අනුව ගෙවිය යුතු Asphalt Binder ප්‍රමාණය මෙ.ටො. 199.16 ක් වූයෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර මෙ.ටොන් 1 කට රු.13,025 බැගින් මෙ.ටොන් 100.84 ක් සඳහා රු.1,313,441 ක මුදලක් ගෙවා තිබුණි. | ඇස්ෆෝල්ට් බයින්ඩර් යොදනු ලබන්නේ මාර්ගයේ අසමතුලිත ස්ථාන (Uneven Surface) සම මට්ටම් කිරීම සඳහාය. එම නිසා Asphalt core cutting හි ඝණකම මඟින් ගණනය කිරීම නිවැරදි නොවේ. ඒ අනුව ගණනය කිරීම් සඳහා කරන ක්‍රමවේදය පිළිගත නොහැක. SSCM අනුව බයින්ඩර් සඳහා ගෙවීම් සිදු කරනු ලබන්නේ වැඩබිමට සපයන ලද බයින්ඩර් මෙට්‍රික් ටොන් ප්‍රමාණය පදනම් කර ගනිමිනි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) අධිකාරියෙන් වැටුප් ලබන රියදුරු මහතෙකු 2013 ජූලි 02 දින සිට පළාත් ප්‍රවාහන හා විදුලිබල අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන අතර අනුයුක්ත කළ දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු.3,924,829 ක වැටුප් හා දීමනා අධිකාරිය විසින් ගෙවා තිබුණි. | 2013 ජූලි 02 දින සිට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර රියදුරු තනතුරෙහි පත්වීම් ලබා ඇති අතර සේවා අවශ්‍යතාවය මත පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පවතින රියදුරු අවශ්‍යතාවය මත ඉදිරියේදී මෙම රියදුරු අධිකාරිය වෙත අනුයුක්ත කර ගැනීමට කටයුතු සිදු කරන බව | මාර්ග සංවර්ධන අධිකාරියේ පුරප්පාඩු පැවතියදී එහි සේවකයන් වෙනත් ආයතන වලට අනුයුක්ත කිරීම නොකළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 571 - මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් නිවාස අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඍජු ණය යටතේ සමූපකාර හා සණස ආයතන මඟින් 1994 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා 880 දෙනෙකුට ලබා දී තිබූ රු.5,682,051 ක ණය මුදල් අයකර ගෙන නොතිබුණි. | මෙම ණය වැඩසටහන් ආරම්භයේදී ක්‍රමානුකූලව ණය අයවීම සිදු වුවද පසුකාලීනව ණයලාභීන් විසින් ගිවිසුමේ ඇති කොන්දේසි කඩ කරමින් ණය ගෙවීම පැහැර හැර ඇත. මූ.රෙ.104 (4) පරීක්ෂණ අවසන් වාර්තාව අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. එහි නිර්දේශ ලැබුණු පසු නියෝග කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16 ශීර්ෂය 581 - පේෂකර්ම දෙපාර්තමේන්තුව**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) අත්තිකාරම් පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය සැසඳීමේදී රු.678,643 ක වෙනසක් විය. | අඹගමුව කෝරළයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ස්ථාන මාරු වි පැමිණි නිළධාරින් 14 දෙනකුගේ ණය ශේෂ නිරවුල් කිරිමේදි සිදුවු දෝෂයක් නිසා මෙම වෙනස ඇති වී ඇත. මෙම වර්ෂය අවසන් වන විට මෙය නිරවුල් කිරිම සඳහා කටයුතු කරමි. | වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වටිනාකම සඳහන් නොවූ ඉඩම් 125 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් 125 ක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. | වත්කම් පවරා ගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.17 ශීර්ෂය 583 - මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 09 දරන පළාත් සභා ක්‍රීඩා ප්‍රඥප්තිය අනුව පළාත් ක්‍රීඩා අරමුදලක් පිහිටුවීමට ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවා නොතිබුණි. | 1990 අංක 09 දරන පළාත් සභා ක්‍රීඩා ප්‍රඥප්තියේ සඳහන් ක්‍රීඩා අරමුදල ආරම්භ කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මධ්‍යම පළාත් සභාවේ 2018 අංක 02 දරන දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම් ප්‍රඥප්තිය අනුව මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණයේ කටයුතු පරිපාලනය, නඩත්තු කිරීම හා ක්‍රීඩා සංවර්ධනය සඳහා මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ පදනම පිහිටුවීම හා ඊට ආනුසංගික කාරණා සඳහා විධිවිධාන සලසා ගැනීම සිදුකර නොතිබුණි. | "මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම " නමින් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා අනුව බහු ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.2,049,192 කට ක්‍රීඩා උපකරණ 1,332 ක් මිලදී ගෙන තිබුණ ද බහු ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම ක්‍රීඩා උපකරණ මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වෙත ලබාදී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඒවා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවල රඳවාගෙන තිබුණි. | අදාළ වෘත්තීය ක්‍රියාකාරි සහභාගිත්වයක් සහිත නිලධාරින් පළාත් පාලන ආයතන වල නොමැති වීමත්, ඒ හා වෘත්තීය ක්‍රියාකාරි සහභාගිත්වයක් දැක්විය හැකි පළාත් ක්‍රිඩා දෙපාර්තමේන්තුවට සම්බන්ධ නිලධාරින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල සිටියත් අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැත. | ක්‍රීඩා භාණ්ඩ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

**1.5.18 ශීර්ෂය 584 - මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සතු ඉඩමක් පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් විසින් මේ සම්බන්ධව 2022 දෙසැම්බර් 05 දිනැති ලිපියක් මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. අදාළ කටයුතු සිදු කරමින් පවතී. | දෙපාර්තමේන්තුව සතු ඉඩම කඩිනමින් පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |

**1.5.19 ශීර්ෂය 590 - කෘෂිකර්ම අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 18/2001 චක්‍රලේඛය ප්‍රකාරව සෑම සේවාවකම නිලධාරීන් වසර 5 ඉක්මවූ පසු ස්ථානමාරු ප්‍රතිපත්තියට යටත්විය යුතු වුවද, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුයුක්ත සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක සහ සංවර්ධන නිලධාරිනියක ස්ථාන මාරුවීම් නොලබා වර්ෂ 09 සිට වර්ෂ 22 දක්වා කාලයක් එකම ස්ථානයක සේවය කරමින් පැවතුණි. | මේ පිළිබඳව ප්‍රධාන ලේකම් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථානමාරු වීම් සිදුකළ යුතුය. |

## 1.5.20 ශීර්ෂය 591 - මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම් 04 ක නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.307,199 ක චෙක්පත් 162 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283.4 අනුව කටයුතු කර නොතිබුණි. | නුවරඑළිය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අදාළ කල් ඉකුත්වූ රු.198,032 ක් වූ චෙක්පත් 81 ක් රජයේ ආදායමට ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, තවද මහනුවර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අදාළ චෙක්පත් 14 ක් අවලංගු කර අදාළ රු.15,925 ක් වූ මුදල ගොවි මහතුන්ගේ ගිණුම් වෙත මුදල් බැර කරන ලද අතර රු.60,452 ක් වූ චෙක්පත් 52 ක් රජයේ ආදායමට ගෙන ඇත. රු.32,789 ක් වූ චෙක්පත් 15 ක් මේ වන විට නිශ්කාශනය නොවී පවතී. | කල් ඉකුත් වූ චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ව්‍යවසායකත්ව කෘෂි අපනයන ගම්මාන වැඩසටහන II අදියර යටතේ දෙකිඳ හා වැලිගොඩවත්ත වසම්වල ප්‍රතිලාභී ගොවීන්ට සියයට 70 ක රජයේ දායකත්වයක් යටතේ ලබාදී තිබුණු එකතුව රු.6,212,376 ක් වූ ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 54 ක් සහ ඊට අදාළව ලබාදී තිබුණු ලීටර් 1500 ප්ලාස්ටික් ජල ටැංකි හා ලීටර් 500 පොහොර ටැංකි ගොවීන්ට ලබාදී මාස 08 ක පමණ කාලයක් ගතවී තිබුණද පරීක්ෂණ දිනවූ 2022 ඔක්තෝබර් 04 දින වනවිටත් එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | ක්ෂුද්‍ර ජල සම්පාදන හා පොහොර සැපයීමේ කට්ටල සඳහා ලීටර1500 ජල සැපයීමේ ටැංකි සහ ලීටර 500 පොහොර ටැංකි ද ලබා දී ඇත.ඒ අනුව දෙකිඳ වසමේ මේ වන විට මෙම කට්ටල සවිකර අවසන් කර ඇත. වැලිගොඩවත්ත වසමේ ආරක්ෂිත ගෘහ ඉදිකිරීම කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතිය මඟින් මෙතෙක් සිදු වී නොමැති බැවින් මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ජල සම්පාදන හා පෙහොර ටැංකි බෙදාහැරීමේ කට්ටල (ජල ටැංකි හා පොහොර ටැංකි ඇතුලුව) සවි කිරිමට නොහැකි වි ඇති බව දන්වමි. | රාජ්‍ය මුදල් යෙදවූ අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් රු.9,096,411 ක් වැය කර පාංශු විද්‍යාගාර 3 ක් නවීකරණය කර තිබූ අතර ඒ සඳහා රු. 43,613,714 ක පාංශු විද්‍යාගාර උපකරණ ලැබී විගණිත දිනවූ 2023 පෙබරවාරි 24 දිනට මාස 09 ක් ගතවී තිබුණද අදාළ පාංශු පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ පාංශු විද්‍යාගාර වෙත නොලැබීම නිසා මෙම වැඩසටහනින් බලාපොරොත්තු වූ අරමුණු මේ දක්වා ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | පාංශු විද්‍යාගාර නවීකරණය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මුල් ඇස්තමේන්තු මුදල රු.මි.24 කි. 2021 වර්ෂයේ ඇති වූ ආර්ථික අර්බුදයත් සමඟ භාණ්ඩ හා උපකරණ මිල අසීමිතව ඉහළයාම නිසා උපකරණ මිලදී ගැනීමට පමණක් රු.මි.46 ක ට අධික මුදලක් වැය කිරීමට සිදුවීම මත සැලසුම් කළ පරිදි පාංශු විද්‍යාගාර නවීකරණයට සහ රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් යෙදවීමට අපහසු විය. 2022 වර්ෂයේ දී විද්‍යාගාර සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය දේශිය වෙළඳපොළ තුල පැවති හිගතාවය නිසා ඒවා සම්පූර්ණයෙන් | අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | මිලදී ගැනීම අපහසු විය. මේ වන විට විද්‍යාගාර නවීකරණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇති බැවින් අදාළ රසායනික ද්‍රව්‍ය අවශ්‍යතාවය සම්පූර්ණ වූ පසු අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි බව දන්වමි. | |
| (ඇ) 2021 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කොම්පොස්ට් පොහොර නිෂ්පාදන වැඩසටහන සඳහා ගල්පාලම ගොවිපල වෙත ලබාදී තිබුණු රු.731,250 ක් වටිනා වල් කැබලි කිරීමේ යන්ත්‍ර 2 ක් තෙකලා විදුලිය සපයා ගැනීමට ප්‍රතිපාදන නොමැතිව අවුරුදු 1 1/2 කට වැඩි කාලයක් ගබඩා පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි. | ගල්පාලම ගොවිපලේ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා මෙම යන්ත්‍ර 02 ක මිලදී ගෙන තිබුණි. 2022 වර්ෂ වල රජයේ පවතින ප්‍රතිපාදන වල හිඟතාවය සහ වියදම් අඩු කර ගැනීම සඳහා කටයුතු කිරීම හේතුවෙන් මෙම යන්ත්‍ර දෙක සඳහාද තෙකලා විදුලි පද්ධතියක් ස්ථාපනය කර ගැනීමට නොහැකි වූ බැවින් මෙම යන්ත්‍ර දෙක ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට නොහැකි වූ බව දන්වා සිටිමි. | තෙකලා විදුලි පද්ධතියක් ස්ථාපිත කර යන්ත්‍ර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව වටිනාකම රු.1,780,388 ක කල් ඉකුත් වූ තැන්පතු 77 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මහනුවර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ රු.29,848 ක් වූ ව්‍යාපෘති දෙකක රැඳවුම් මුදල් නිදහස් කිරීමේ කටයුතු සඳහා දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු වෙත ලිපි යොමු කර ඇති බවත්, මාතලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ තැන්පතු 48 ක් ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතින බවත්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ව්‍යාපෘති 10 ක රු.2,971,672 ක අත රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බවත්, නුවරඑළිය නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතින බවත් දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) වසර 04 ට වැඩි සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු.200,690 ක ණය ශේෂයක් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.3, 4.4, 4.5, 4.6 වගන්තීන් අනුව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කොළඹ නීතිපති දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥවරයෙකු වෙත අවශ්‍ය ලිපි ලේඛණ ඉදිරිපත් කර ඇත. | ආයතන සංග්‍රහය පරිදි කටයුතු කළ යුතුය. |

**1.5.21 ශීර්ෂය 592 – පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය රීති 378.2 අනුව අත්තිකාරම් ගිණුම් කටයුත්තක ශුද්ධ අතිරික්තය පළාත් සභා ආදායම් ශීර්ෂයට බැර කළ යුතු වුවද මධ්‍යම පළාත් සභාවේ ඖෂධ සැපයීමේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.22,411,955 ක සමුච්චිත අතිරික්තයක් පැවති අතර එය වාර්ෂිකව පළාත් සභා ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ලාභයෙන් කොටසක් පළාත් භාණ්ඩාගාරය ට එවීමටත් එම මුදල් පළාත් භාණ්ඩාගාරයේ සංචිත ගිණුමක් ලෙස පවත්වා ගනිමින් අත්තිකාරම් ගිණුම සඳහා අරමුදල් අවශ්‍ය වූ විටක නැවත ලබා ගැනීමට හැකි වන අයුරින් ක්‍රමවේදයක් පළාත් භාණ්ඩාගාරය හරහා සිදු කර නොමැති බැවින් අතිරික්ත මුදල් ප්‍රමාණය ඖෂධ අවශ්‍යතා සඳහා ගිණුමේ රඳවා ගත් බවත් දන්වා සිටිමි. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2012 මාර්තු 29 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියට අනුව පළාත් රාජ්‍ය සේවාවේ නියුතු, ක්ෂේත්‍ර නිලධාරීන්ට වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමෙන් තොරව පළාත් ආණ්ඩුකාර වරයාගේ අනුමැතියෙන්, පරිවර්තිත ගමන් වියදම් දීමනාවක් හිමි පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ව සංවර්ධන උපදේශක නිලධාරීන්ට, කෘතිම සිංචන සේවාව සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.7,106,823 ක ප්‍රවාහන වියදම් දීමනාවක් ගෙවා තිබුණි. | වර්තමානය වන විට පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක නොවන බැවින් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ සත්ත්ව සංවර්ධන උපදේශකවරුන්ට එක් කෘතිම සිංචනයක් සඳහා ගොවීන්ගෙන් අය කරන රු.700 ක මුදල දෙපාර්තමේන්තු පොදු තැම්පත් ගිණුමේ තැම්පත් කිරීමෙන් පසු එම තැම්පත් මුදලින් සියයට 90 ක ප්‍රතිපූරණයක් කරනු ලබන බව දන්වා සිටිමි. | නීති රීති රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ඇ) විවිධ සංවර්ධන ව්‍යාපෘති 42 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.1,724,669 ක මුදල 2022 දෙසැම්බර් 31 දිනටත් අදාළ කාර්යයන්හි නොයෙදවා මාස 03 සිට වර්ෂ 02 ක් දක්වා කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘති වලින් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබු ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 5 ක මුදල් මේ වන විට රජයේ ආදායමට ගෙන ඇති අතර අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් පශු වෛද්‍ය කාර්යාල කිහිපවතාවක් දැනුවත් කර ඇතත් මේ වන තෙක් අදාළ ව්‍යාපෘති සම්බන්ධයෙන් වවුචර් ඉදිරිපත් නොවූ | ව්‍යාපෘති මුදල් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යොදවා ගත යුතුය. |

| | | |
|---|---|---|
| | බැවින් අදාළ ශේෂ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති අතර වසර 2 ඉක්මවීමෙන් පසු රජයේ ආදායමට ගැනීමට කටයුතු කරමි. | |
| (ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාවේ දී මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක වල පශු වෛද්‍ය කොට්ඨාශ 4 ක ව්‍යාපෘති 7 ක ප්‍රතිලාභීන් 10 දෙනෙකුට සියයට 50 රජයේ දායකත්වය යටතේ එකතුව රු.1,173,500 ක ප්‍රතිලාභ ලබාදී තිබුණද පසුවිපරම් කටයුතු සිදුකිරීම, ගිවිසුම්ගත කොන්දේසි ක්‍රියාත්මක කිරීම, ප්‍රතිලාභීන් අදාළ කර්මාන්තය තුළ රඳවාගැනීමට උනන්දු කිරීම වැනි කාර්යයන් ඉටු නොවීම මත ප්‍රතිලාභීන් ව්‍යාපෘති වලින් බැහැර වීමෙන් ලබාදී තිබූ උපකරණ ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතීම හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පශු වෛද්‍ය කොට්ඨාශ 4 වන්නේ යටිනුවර, කුණ්ඩසාලේ, මාතලේ සහ නාඋල වේ. එහි වර්තමාන තත්වය පහත පරිදි වේ. | ව්‍යාපෘති අරමුණු කාලීනව ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| පශු වෛද්‍ය කොට්ඨාශය | ව්‍යාපෘති ගණන | වර්ථමාන තත්ත්වය |
|---|---|---|
| යටිනුවර | 5 | ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක නොවේ. එක් ව්‍යාපෘතියක යන්ත්‍රය වෙනත් පශු වෛද්‍ය කාර්යාලයකට ලබා දී ඇත. |
| කුණ්ඩසාලේ | 5 | තිදෙනෙකු ක්‍රියාත්මක නොකරයි. ව්‍යාපෘති 2 ක් අවසාන අධියරේ පසුවේ. |
| නාඋල | 2 | එක් ව්‍යාපෘතියක යන්ත්‍රය ක්‍රියා විරහිතව ඇත. |
| මාතලේ | 3 | එක් ප්‍රතිලාභියෙකු ව්‍යාපෘතියෙන් ඉවත් වී ඇත. |

| | | |
|---|---|---|
| (ඉ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඉකුත් වර්ෂවල සුළු පරිමාණ කිරි ගොවිපල් වැඩසටහන හා දියර කිරි නිෂ්පාදන ප්‍රවලිත කිරීමේ වැඩසටහන යටතේ මිලදීගෙන තිබුණු වටිනාකම අනාවරණය කරනොගත් උපකරණ වර්ග 24 කට අදාළව අයිතම 105 ක් ප්‍රතිලාභීන්ට බෙදාහැරීමට කටයුතු නොකර පළාත් අධ්‍යක්ෂ කාර්යාල ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. මෙම අයිතම කීපයක් පුහුණු වැඩසටහන්වලට යොදාගත් බවට විගණනයට ප්‍රකාශ කළද එම අයිතම වෙන්ව හඳුනාගැනීමට සාක්ෂි නොවුණි. | මධ්‍යම ගබඩාවේ පවතින භාණ්ඩ වර්ග 24 න් වර්ග 11 කට අදාළ භාණ්ඩ පළාත් අධ්‍යක්ෂ කාර්යාල මඟින් ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරනු ලබන බවත්, වර්ග 07 කට අදාළ භාණ්ඩ දියර කිරි නිෂ්පාදනය ප්‍රවලිත කිරීමේ අරමුණින් පාසල් ළමුන් සඳහා දියර කිරි ලබා දීමේ වැඩසටහන වෙනුවෙන් පශු වෛද්‍ය කාර්යාල වෙත ලබා දී තිබුණ ද සෞඛ්‍යමය හා වෙනත් ගැටළු හේතුවෙන් අක්‍රිය වු බවත් වැඩසටහන සඳහා මිලදී ගත් ඇතැම් භාණ්ඩ තව දුරටත් මධ්‍යම ගබඩාවේ පවතින බවත් වර්ග 05 කට අදාළ භාණ්ඩ සුළු පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය කිරීම, දියර කිරි නිෂ්පාදය ප්‍රවලිත කිරීම හා කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ පශු වෛද්‍ය කොට්ඨාස මට්ටමින් හඳුනා ගන්නා ලද සුදුසු ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර ඇති බවත්, පශු වෛද්‍ය කාර්යාලවල භාවිතය සඳහා අනු අංක 24 යටතේ වූ භාණ්ඩ අයිතම අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කර ඇති බවත් දන්වයි. | මිලදී ගත් උපකරණ අදාළ අරමුණට යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) අත්තිකාරම් පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය සැසඳීමේදී රු.316,752 ක වෙනසක් විය. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර රු.316,715 ක වෙනසක් පැවතීමට හේතුව පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි සෑම අයුරින්ම ගිණුම් පොත්පත් හා ලේඛණ පරීශීලණය කරමින් පරීක්ෂා කිරීම් සිදුකළ ද වෙනසට හේතු වූ කරුණු සොයා ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමි. | වෙනස හඳුනාගෙන සුදුසු පරිදි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |